2024.12.20 අරුණ

පිටු 6

# පහළොස් වැනි ජන හා නිවාස සංගණනය සාර්ථකව අවසන්



සංගණනයේ අවස්ථාවක්

■ අනීෂා මානගේ

ඡායාරූප - ඉෂාන් සංජීව

ශ්‍රී ලංකාවේ පහළොස් වැනි ජන හා නිවාස සංගණනය සාර්ථකව අවසන් කළ බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.

මෙරට ජීවත්වන සියලු පුරවැසියන්ගේ නිවාසවල තොරතුරු රැස්කිරීම ඉකුත් ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ කෙරිණි. පදිංචි වීමට ස්ථිර ස්ථානයක් නොමැති පුද්ගලයන්ගේ තොරතුරු රැස්කිරීම පෙරේද (18 වැනිදා) රාත්‍රියේ සිදුකෙරිණි. මෙම පුද්ගලයන් වැඩිපුර ගැවසෙන ස්ථාන සොයා දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි මීට ඉහතදී තොරතුරු රැස්කරගෙන තිබූ අතර පෙරේද (18 වැනිදා) රාත්‍රියේ එම ස්ථාන කරා ගොස් එම තොරතුරු ක්‍රමානුකූලව ලේඛනගත කෙරිණි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව මේ කාර්ය සඳහා සියලු දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධාරි කණ්ඩායම් රැසක් සහභාගී වී සිටියහ. ඒ වෙනුවෙන් නිලධාරීන් තිස්දහසකට අධික පිරිසක් එක්ව සිටි අතර කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ දිස්ත්‍රික් මහලේකම් කාර්යාලයට අයත් ප්‍රදේශයේ සිටින හිසට වහළක් නැති' පුද්ගලයන්ගේ තොරතුරු රැස්කිරීමට කණ්ඩායම් හතරක් යොදවා තිබිණි.

ඒ අනුව පිටකොටුව, ගුණසිංහපුර, මරදාන, කොටුව, තොටළඟ, කොටහේන, කොච්චිකඩේ, පංචිකාවත්ත ආදී ප්‍රදේශ රැසක සිටි 'හිසට වහලක් නැති' පුද්ගලයන් සියලුදෙනාගේ තොරතුරු පෙරේද (18 වැනිදා) රාත්‍රී 10.00 සිට පසුදින අලුයම 2.00 අතර කාලයේදී රැස් කෙරිණි.

මෙම වසරේ දෙසැම්බර් 31 වැනිදා වන විට සංගණනයේ තොරතුරු නිකුත් කළ හැකි වනු ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනුජා සෙනෙවිරත්න පැවසීය.